# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,111 — 1960 අප්‍රේල් 22 වැනි සිකුරාද — 22.4.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන — — | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 77 | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් — — | — |


## අතුරු ව්‍යවස්ථා

L.G.D.—GC 14/5.

### ගම්සභා ආඥපණත

ගම්සභා ආඥපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1960, අප්‍රේල් 6 වැනි දින
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

#### අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත

1. (අ) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කොප්පරා සෑදීම,
(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(3) තොග ගණනේ විකිණීම පිණිස නරක්වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම,
(4) කොම්පෝස්ට් පොහොර හෝ කෘතිම පොහොර සෑදීම,
(5) විනාකිරි සෑදීම,
(6) සබන් සෑදීම,
(7) හම් පදම් කරන ස්ථානයක් තබාගැනීම,
(8) පූවක් වියලා සකස් කිරීම,
(9) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණුකිරීම,
(10) සතුන්ගේ හම් ගබඩා කිරීම,
(11) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම,
(12) මාළු අයිස් දැමීම,
(13) ලෑලි හෝ දැවදඬු පොඟවා සකස් කිරීම,
(14) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හා සෑදීම,
(15) කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,
(16) සෝඩා සෑදීම,
(17) දුම්කොළ වියලා සකස් කිරීම,
(18) සුරුට්ටු හෝ සිගරැට් සෑදීම,
(19) පැණි හකුරු සෑදීම,
(20) රා එකතු කිරීමේ ස්ථානයක් තබාගැනීම,
(21) බීඩි සෑදීම.

(ආ) පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කබුක් ගල් හෝ බොරලු ලබාගැනීමට ගල්වළවල් කැපීම,
(2) කොප්පරා ගබඩා කිරීම,
(3) පිදුරු ගබඩා කිරීම,
(4) කපාපු පොල් සකස් කිරීම,
(5) මිරිස් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම,
(6) වළක් කැනීමෙන් හුනුගල් ලබාගැනීම,
(7) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම,
(8) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම,
(9) පැඟිරිතෙල් සිඳීම,
(10) කුරුඳුතෙල් සිඳීම,
(11) කෙඳි වගී තෙලීම හෝ ගබඩා කිරීම,
(12) කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම,
(13) ලී මඩුවක් තබාගැනීම,
(14) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම,
(15) ස්වර්ණාභරණ සාදන ස්ථානයක් තබාගැනීම,
(16) කම්හල් කර්මාන්තය කරගෙනයාම,
(17) මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම,
(18) අම්ලකර වායුව පාවිච්චි කරන කිසියම් කර්මාන්තයක්,
(19) හාල් මෝලක් තබාගැනීම.

(ඉ) පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූද අන්තරාදායකවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි සායම් කිරීම,
(2) ගඩොල් හෝ උළු සෑදීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, හෝ කැබලි කිරීම.

L.G.D.—GC 14/11.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ, සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශණයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ ඇමැති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1960 අප්‍රේල් 6 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

1. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසලශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්ය සභාව වෙත ගෙවිය යුතු මාසික අශුචි ඉවත් කිරීමේ ගාස්තු එක් එක් බාල්දිය සඳහා රුපියල් දෙකයි ශත පනහ බැගින් වියයුතු වන්නේ ය.

2. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කශලශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන කාරණා සඳහා කාර්ය සභාව වෙත ගෙවියයුතු මාසික කශල ශෝධන ගාස්තුව ශත විසිපහ බැගින් විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල "කාර්ය සභාව" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිලැස්ස ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

---

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ මැදපලාත කෝරලේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශන යෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

වර්ෂ 1960 ක් වූ අප්‍රියෙල් මස 6 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

#### අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත

1. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කබුක් ගල් හෝ බොරලු සඳහා ගල් වළවල් හෑරීම,

(2) හුණු ගල් ලබාගැනීම සඳහා වළක් කැපීම,

(3) කෙඳිවර්ග නෙළීම හෝ ගබඩාකිරීම,

(4) කපු පුලුන් (නූල් ආදිය) ගබඩාකිරීම,

(5) ලී හෝ දර හෝ ගබඩාකිරීම,

(6) කම්හලක් තබාගැනීම,

(7) ස්වර්ණාභරණ සාදන ස්ථානයක් තබාගැනීම,

(8) හාල් මෝලක් තබාගැනීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) ජාඩි හෝ කරවල ගබඩාකිරීම,

(2) තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩාකිරීම,

(3) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම,

(4) හම් පදම්කරණ ස්ථානයක් තබාගැනීම,

(5) සතුන්ගේ ලේ හෝ මළකුණු හෝ උණුකිරීම,

(6) සතුන්ගේ හම් ගබඩාකිරීම,

(7) සතුන්ගේ ඇටකටු ගබඩාකිරීම,

(8) පුවක් වියලීම,

(9) ලැලි පොගවා සකස් කිරීම,

(10) දුම්කොළ වියලීම හෝ සකස්කිරීම,

(11) සුරුට්ටු, සිගරැට් හෝ බීඩි සෑදීම,

(12) පැණිහකුරු සෑදීම,

(13) කම්මල් කර්මාන්තය කරගෙනයාම.

3. පහත දැක්වෙන කර්මාන්ත අන්තරායදයකවූද අප්‍රසන්නවූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ :—

(1) කෙඳි සායම්කිරීම,

(2) ගඩොල් හෝ උළු පිච්චීම,

(3) බැටරි චාජ් කිරීම,

(4) හුණුගල් පිච්චීම, ගබඩාකිරීම, සකස්කිරීම හෝ කැබලිකිරීම.

---

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කඳුකර ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960වේ අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1957 තේ අප්‍රේල් මස 26 වැනි දින අංක 11,112 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය අවසානයට මෙහි පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇල්) වඩු මඩුවක් තබා ගැනීම ;

(ඇම්) මෝටර් රථවාහන අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොළක් තබා ගැනීම ;

(ඇන්) ගෘහ භාණ්ඩ සෑදීම."

L.G.D.—GB. 14/22/4.

## ගම්සභා ආඥපණත

ගම්සභා ආඥපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වෙනි දින අංක 9,773 දරණ "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියේ පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. (1) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුල—

(අ) කිසියම් ගම්බද පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත ; හෝ

(ආ) යථාකාලයේදී ගම්බද පාරක් බවට පත් කරනු ලැබිය හැකියයි ගම්කාර්‍ය සභාව විසින් දැනුම්දෙනු ලැබුවාවූ කිසියම් ගම්බද මාවතක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ,

(ඇ) මේ ඡේදයේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද මාවතකින් බාහිරවූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත අලුත් ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(2) කිසිවකු විසින් ලියවිල්ලකින්වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධාන තුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම ගම්බද පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩනැගිල්ලකින් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම්ප්‍රදේශය ඇතුළත සෑදිය යුතු නැත.

2. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ගම්ප්‍රදේශය" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

"ගම්බද පාර" යනුවෙන් ගම්කාර්‍ය සභාව මගින් නඩත්තු කර ගෙන යනු ලබන්නාවූ ද, පළලින් අඩි නවයකට වඩා අඩු නොවූද පාරක් අදහස් කරනු ලැබේ.

"ගම්බද මාවත" යනුවෙන් කාර්‍ය සභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන්නාවූද, පළලින් අඩි නවයකට වඩා අඩුවූද පාරක් අදහස් කරනු ලැබේ.

---

L.G.D.—GB. 14/22/3.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත්පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### ආයුර්වේද බෙහෙත් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. ගම්සභා ආඥපණතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ කාර්‍ය සභාව විසින් ඌරගස්මන්හන්දියේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්‍ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවාත් හැර, 1941 කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥපණත යටතේ ලියා පදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු බාරයේ තැබිය යුතුද වන්නේය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු විසින් හෝ කාර්‍ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියකු විසින් හෝ ආයුර් වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳව කාර්‍ය සභාව විසින් නියම කරනු ලබන යම් යම් පොත් පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්‍ය සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේය.

3. කාර්‍ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්‍ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළ හැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්‍ය සභාවේ වාර්ෂික අය වැය ලේඛනයෙන් හෝ වරින් වර කාර්‍ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ මුදල් වෙන්කළ යුතුද වන්නේය.

4. 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට යටත්ව ආයුර් වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර නොමිලයේ සැපයිය යුතුවාත් හැර එකී ප්‍රතිකාර කොස්ගොඩ ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමාවිය යුතුද වන්නේය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධ වල වටිනාකමෙන් කොටසක් පියවා ගැණීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 50 බැගින් වූ ගාස්තුවක් කාර්‍ය සභාව විසින් අයකළ යුතු ය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාර්‍ය සභාව විසින් අනුමත කරන ලද ආකෘතිපත්‍රයකින් රෝගියෙකුගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වන්නේය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනුපිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේය.

6. සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළහැකි වන්නේය.

7. සභාපති තුමා විසින් දෙසැම්බර් මාසයේ 31 වැනි දායින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්-වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල්ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේය.

8. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්‍ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ.

"සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් ගාලු දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

L. G. D. G. B 14/27/9.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටිය ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹදීය.

### තොටුපල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. කාර්යසභාව විසින් ගම්ප්‍රදේශය ඇතුළත තොටුපළක් පිහිටුවනු ලබණ කල්හි, එකී තොටුපළ පිහිටුවීම පිළිබඳව සභාපතිතුමා විසින් අණබෙර ගැස්වීමෙන් දැන්වීමක් කළ යුතුය.

2. කාර්යසභාව විසින් පිහිටුවනු ලබන්නාවූ හෝ නඩත්තු කර ගෙන යනු ලබන්නාවූ හෝ කිසියම් තොටුපළක ගාස්තු එකතු කිරීමේ අයිතිය (අ) පෞද්ගලික ගිවිසුමකින්, (ආ) ප්‍රසිද්ධ වෙන්දේසියකින්, හෝ (ඇ) ටෙන්ඩර් මාර්ගයෙන් ඕනෑම කෙනෙකුට බදුදීමට එකී කාර්ය සභාවට පිලිවන.

3. කාර්යසභාව විසින් පිහිටුවනු ලබන්නාවූ හෝ නඩත්තු කර ගෙන යනු ලබන්නාවූ හෝ කිසියම් තොටුපළකින් අය කරන සියලුම ගාස්තු සභාපතිතුමා විසින් ලියවිල්ලකින් පත්කරන තොටියකු විසින් හෝ, බදුකරුවා විසින් හෝ සභාපතිතුමාගේ ලියවිල්ලකින්වූ අනුමැතිය ඇතිව බදුකරුවා විසින්, පත්කරනු ලබණ කිසියම් අයෙකු විසින් හෝ එකතු කළයුතු වන්නේය.

4. තොටුපළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සඳහන් කරන ලද දැන්වීමක් තොටුපලේ කාටත් පෙණෙන ස්ථානයක ප්‍රදර්ශනය කරවීමට සභාපතිතුමා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, කිසිවකු විසින් එකී දැන්වීමේ සඳහන් එම ගාස්තුවලට වඩා වැඩිවූ කිසිම ගාස්තුවක් කිසිවෙකුගෙන් අයකළයුතු හෝ ලබාගත යුතු හෝ නොවන්නේය.

5. මගීන් ගෙනයාම හෝ බඩු බාහිරාදිය හෝ රථවාහන රැගෙන යාම හෝ සඳහා තොටුපළේ සපයා ඇති යාත්‍රාව ඒ සඳහා පාවිච්චි නොකරන කල්හි කිසියම් තොටුපළක් සම්බන්ධයෙන් පනවනු ලබණ ගාස්තු නොගෙවිය යුතුවාත් හැර අයකළයුතුද නොවන්නේය.

6. විධිවූ පරිදි පත් කරනු ලැබූ තොටියකු නොවූ වෙනත් කිසිවෙකු විසින් කිසියම් ගඟක හෝ දොළක කාර්ය සභාව විසින් විධිවූ පරිදි ගාස්තු පණවන ලද කිසියම් තොටුපළකින් හෝ කිසියම් තොටුපළක සිට හෝ ගඟ ඉහළට හෝ ගඟ පහළට හැතැප්මක් ඇතුළත කිසිම ඔරුවකින් හෝ වෙනත් කිසියම් ඔරුපාරු විශේෂයකින් හෝ ස්වකීය දේපලක් නොවූ කිසියම් බඩු බාහිරාදියක් රථවාහනයක් හෝ සතෙකු හෝ ස්වකීය සේවයේ නියුක්ත නොවූ කිසියම් මගියකු හෝ කිසියම් ගාස්තුවකට හෝ පාරිතෝෂික මුදලකට හෝ එගොඩ මෙගොඩ කළ යුතු නැත.

7. කාර්ය සභාවෙන් කලින් ලබාගත් අවසරය නොමැතිව ගම් ප්‍රදේශය ඇතුළත පෞද්ගලික තොටුපළක් පිහිටුවිය යුතු නැත.

8. කාර්යසභාව විසින් නඩත්තු කරගෙන යනු ලබන සියලුම තොටුපළවල් පිළිබඳ ලේඛණයක් තබාගැනීමට සභාපතිතුමා විසින් කටයුතු සැලැස්විය යුතුය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපතිතුමා" යනුවෙන් කාර්යසභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ;

"කාර්යසභාව" යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ;

"ගම්ප්‍රදේශය" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටිය ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

ඇල්.ජී.ඩී.—ජීරී 14/21.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල-මාබොදලේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලය ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 වෙනි දින,
කොළඹදීය.

### ආයුර්වේද බෙහෙත් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ කාර්ය සභාව විසින් පිහිටුවනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවාත් හැර, 1941 කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥාපනත යටතේ ලියා පදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු විසින් හෝ කාර්ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ කාර්ය සභාව විසින් නියම කරනු ලබන යම් යම් පොත් පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්ය සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේය.

3. කාර්ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළ හැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්ය සභාවේ වාර්ෂික අය වැය ලේඛණයෙන් හෝ වරින්වර කාර්ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් මුදල් වෙන්කළ යුතුද වන්නේය.

4. 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර නොමිළයේ සැපයිය යුතුවත් හැර එකී ප්‍රතිකාර උඩුගම්පොල-මාබොදලේ ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමා විය යුතුද වන්නේය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධ වල වටිනාකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 50 බැගින්වූ ගාස්තුවක් කාර්ය සභාව විසින් අයකළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාර්ය සභාව විසින් අනුමත කරන ලද ආකෘතිපත්‍රයකින් රෝගියෙකුගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වන්නේය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනු පිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේය.

6. සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළහැකි වන්නේය.

7. ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා හිතවතුන්ගෙන් ලැබෙන යම් යම් පරිත්‍යාග මුදල් එම ආයුර්වේද බෙහෙත් ශාලාවේ වියහියදම් සඳහා පාවිච්චි කළ යුතු වන්නේය.

8. සභාපතිතුමා විසින් දෙසැම්බර මාසයේ 31 වැනිදාසින් අන්තිම්වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබන මුදල් හා ඒ සම්බන්ධයෙන් විය පැහැදම් වන මුදල්ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ;

"සභාපතිතුමා" යනුවෙන් කාර්ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ;

"කාර්ය සභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල-මාබොදලේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

ඇල්. ජී. ඩී. ජී. බී 14/27/10.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටිය ගම් ප්‍රදේශයේ ගම්සභා කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 වේ අප්‍රේල් මස 6 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

**ගොඩනැගිලි හා මාසිම් තාප්ප සෑදීම**

1. කිසිවකු විසින් ගම් ප්‍රදේශය ඇතුළත :—

(අ) යම්කිසි ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණය ඇතුළත හෝ,

(ආ) යථා කාලයේ දී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි කාර්‍ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි පසළොසක දුර ප්‍රමාණය ඇතුළත හෝ,

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ආ) උපඡේදයේ සඳහන් කරන ලද මාවතකින් බාහිරවූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි දහයක දුර ප්‍රමාණයක ඇතුළත හෝ,

කිසියම් අළුත් ගොඩනැගිල්ලක් මාසිම් තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ සෑදිය යුතු නැත.

2. ලියවිල්ලකින් වූ දැන්වීමකින් අඩු ගණනේ දවස් තිහකට කලින්වත් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද කිසියම් කරත්ත පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මාසිම් තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ සෑදිය යුතු නැත.

3. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධාන තුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ ;

"කාර්‍ය සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;

"ගම් ප්‍රදේශය" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටිය ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

ඇල්. සී.—බී. 102/45
ඇල්. ජී. සී.—ජී අයි 11/36

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේ ගම්පහ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 අප්‍රේල් මස 6 දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

**අශුචි ඉවත් කිරීම හා කසළශෝධනය**

1. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසල ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල vi වැනි කාණ්ඩයේ 6 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාව වෙත ගෙවිය යුතු මාසික අශුචි ඉවත් කිරීමේ ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එක බැගින් වන්නේ ය.

2. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසල ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ 11 වෙනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාව වෙත ගෙවිය යුතු මාසික කසල ශෝධන ගාස්තුව ශත පණහ බැගින් විය යුතු වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල "කාර්‍ය සභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේ ගම්පහ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

---

ඇල්. ජී. ඩී.—ජීඩී 14/41.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ කම්මල් පත්තු ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශණයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන.

1960 අප්‍රියෙල් 6 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

ගම්කාර්ය සභාව විසින් සම්මත කර ගන්නා ලද වෙළඳ පොළවල් හා කඩපොළවල් පිළිබඳ වූ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාරණා සඳහා වූ "වෙළඳ ප්‍රදේශය" වෙන්නප්පුවේ පිහිටි ගම්බද වෙළඳ පොළේ මැදසිට සැතපුම් හතරෙන් තුන් පංගුවක අර්ධ විෂ්කම්භය ඇති චක්‍රයක් ඇතුළත වූ ප්‍රදේශය වියයුතු වන්නේ ය.

---

## විශෙෂ නිවේදනයයි

1960 මැයි 10 වැනි අඟහරුවාදා සහ 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 මැයි 13 වැනි දා නිකුත් කරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 මැයි 6 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

**1960 අප්‍රේල් 9 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය,**
**කොළඹ.**

**බර්නාඩ් ද සිල්වා,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.